# වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයන් වහන්සේගේ ශිෂ්‍යවරයන් වහන්සේලාගෙන් සිදු වූ ශාසනික හා ශාස්ත්‍රීය සේවය

විල්ගමුවේ පියනන්ද හිමි

## ප්‍රවේශය

මහින්දාගමනයත් සමග මෙරට ඇති වූ බෞද්ධ ප්‍රබෝධය ශාසනික හා ශාස්ත්‍රීය මෙන්ම සංස්කෘතික වශයෙන් දියුණු වෙමින් රාජධානි අනුව කරන ලද යුග භේදයෙන් වරෙක පෙරටුගාමීව ද වරෙක පසුගාමීව ද දියුණුවෙමින් මෙන්ම පරිහානියට පත්වෙමින් ද මෙරට සම්බුද්ධ ශාසනයෙහි පැවැත්ම සිදුවිය. ශාස්ත්‍රීය ලෝකයෙහි පැවැත්ම ද එබඳුම විය. බොහෝවිට ඓතිහාසිකව ගොඩනැගුණු ඒ ඒ යුගයන් අවසන් වීමට හේතු වී ඇත්තේ සම්බුද්ධ ශාසනයට හා ශාස්ත්‍ර උන්නතියට වූ පරිහානියත් සමගමය. එය ප්‍රාරම්භ යුගය වන අනුරාධ පුර යුගයෙහි අවසානයෙන් පැහැදිලි වේ. එමෙන්ම නව යුගයක් ආරම්භව දීප්තිමත් වී ඇත්තේ ද එම යුගයෙහි සිදුවන ශාසනික හා ශාස්ත්‍රීය දියුණුවෙහි තරමටය. කෝට්ටේ යුගයෙහි දීප්තිමත්ව පැවති මෙරට ශාසනික හා ශාස්ත්‍රීය දියුණුව කෙමෙන් ශේෂව මහනුවර යුගය වන විට අත්‍යන්ත පරිහානියට පත්ව තිබුණි. ඒ සඳහා මෙරට පෙර යුග පරිහානියට තුඩුදුන් කරුණු මෙන්ම සුවිශේෂී වු කරුණු ද හේතු වී ඇත. ඒ අතර

- ❖ රාජ්‍ය ආරක්ෂාව නැතිවීම.
- ❖ ක්‍රිස්තියානි බලපෑම

- ❖ දේශපාලන විප්ලවය.
- ❖ කාලීන විප්ලව හා ඉන්දු ද්‍රවිඩාභාසය
- ❖ ආර්ථික ක්‍රමය
- ❖ කුලභේදය
- ❖ ඥාති ශිෂ්‍ය ක්‍රමය
- ❖ රක්ඛංග රටින් ගෙනා උපසම්පදාව[1]

මෙයට අමතරව ජනතා අසමගිය මෙන්ම තත්කාලීන ශ්‍රමණ වේෂධාරීන්ගේ දුශ්ශීල පැවැත්ම ද මේ සඳහා හේතු වූ බව පැහැදිලිය. මෙබඳු වූ හේතුන්ගෙන් මහනුවර යුගය වන විට ශාසනික පරිහානිය ප්‍රමණය කළ නොහැක.එවන් යුගයක සෙංකඩගල නුවර රාජ්‍යත්වයට පත් වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සමයෙහි (ක්‍රි. ව. 1707-1739) සූරිය ගොඩ සාමණේරයන්ට ශිෂ්‍යව වැලිවිට කුලතුංග පරපුරට අයත් කුලතුංග කුමරු සරණංකර නමින් පැවිදි විය.[2] මෙම සිදුවීම මහනුවර යුගයෙහි ශාසනික හා ශාස්ත්‍රිය පරිහානිය නැවතීමටත් එහි උන්නතිය ඇති කිරීමටත් හේතු විය.

මහනුවර යුගයෙහි ශ්‍රී ලාංකේය සංඝ සංස්ථාව සංඝශෝභන ගුණ ධර්මයන්ගෙන් හීනව ගිහියන් විසින් සිදු කළ යුතු නැකත්, වෙදකම්, ගොවිතැන්, වෙළඳාම් ආදී අකර්තව්‍යයෙහි යෙදී සිටි භික්ෂු පිරිසක් බව **සංඝරාජ සාධු චරියාවට** අනුව පැහැදිලිය.[3] එවක භික්ෂු වේෂධාරී එම පිරිස ගණින් වහන්සේලා නමින් හඳුන්වා ඇත. වැලිවිට සරණංකර සාමණේරයන් වහන්සේට මෙම පිරිස සැබෑ බුද්ධපුත්‍රයන් වහන්සේලා නොවන බව ප්‍රව්‍රජ්‍යාවට පත්ව කෙටි කලකින්ම වැටහෙන්නට විය. එතැන් පටන් උන්වහන්සේ තත්කාලීන සංඝ සමාජයෙහි පැවති දුශ්ශීල චර්යාවන් තමන් වහන්සේ විසින් පළමුව වෙනස්



කොට ආදර්ශමත් සංඝශෝභන ගුණධර්මයන් ඇති කරගනිමින් මෙතෙක් අභාවයට ගිය ශාසනික වත් පිළිවෙත් යළි ඇති කරවීමට කටයුතු කළහ.

බුදුදහම මනාව උගත් භික්ෂූන් මෙම වකවානුවෙහි නොසිටීම මෙම ශාසනික පරිහානියට හේතු වූ බව අවබෝධ කරගත් වැලිවිට සරණංකර සාමණේරයන් වහන්සේ බුදුදහම පාලි භාෂාවෙන් ඇති බැවින් පාලි භාෂාව ඉගෙනීමට උත්සුක වූහ.[4] එම උත්සාහය මහත් අසීරුවෙන් සඵල කරගත් උන්වහන්සේ මාකෙහෙල්වල ගල්ලෙනක සිරකරුවෙකු ලෙසින් සිරකර සිටි ලෙව්කේ රාළගෙන් සතිපට්ඨාන සූත්‍රය හා **බාලාවතාරයේ** නාම කාණ්ඩයත්, පල්කුඹුරේ අත්ථදස්සි සාමණේරයන්ගෙන් **බාලාවතාරයෙහි** සමාස කාණ්ඩයත් මහත් පරිශ්‍රමයෙන් ඉගෙන ශාස්ත්‍රාභිලාෂය සපුරාගත්හ. අනතුරුව උන්වහන්සේ විසින් සිල්වත් සමාගම නමින් සමාගමක් පිහිටවා එම සමාගමට භික්ෂු කණ්ඩායම් එක්රැස් කරගනිමින් එම පිරිස භික්ෂු ආකල්ප සම්පත්තියට ගැළපෙන අයුරින් සකසවා ධර්ම විනය ගැන මෙන්ම පාලි භාෂාව පිළිබඳව ද දැනුමක් ඇති පිරිසක් බවට පත්කරන ලදී. සංස්ථාවක් වශයෙන් ශක්තිමත් වූ සිල්වත් සමාගම මූලික කරගත් වැලිවිට සරණංකර හිමියෝ මෙරට ඒ වන විට අභාවයට ගොස් තිබූ උපසම්පදාව යළි ඇති කිරීම ප්‍රමුඛ කොට ගත් ශාසනික හා ශාස්ත්‍රීය පුනර්ජීවනය ඇති කිරීම සඳහා කටයුතු කළහ. එහිදී වැලිවිට සංඝරාජ හිමියන්ගේ ඇසුර ලද පළමු ශිෂ්‍ය කණ්ඩායම ලෙස සිල්වත් සමාගමට අයත් පිරිස වැදගත් වේ.